# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 53 දරන ධර්මායතනය ආරක්ෂක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 දෙසැම්බර් මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 දෙසැම්බර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 8.25 යි. තැපැල් ගාස්තුව **:** රු. **5.00** යි.

## 2006 අංක 53 දරන ධර්මායතනය ආරක්ෂක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2006 දෙසැම්බර් මස 21 වන දින]

එල්. ඩී. ඕ.—අයි එන් සී 13/2005

ධර්මායතනය ආරක්ෂක සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"ධර්මායතනය ආරක්ෂක සභාව" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ සංගමයේ සියළු පරමාර්ථ සහ ඒ හා සම්බන්ධ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවෙහි කොළඹ, පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුයේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද, සහ එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2006 අංක 53 දරන ධර්මායතනය ආරක්ෂක සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට හා ඉන් පසු, (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ධර්මායතනය ආරක්ෂක සභාවේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) "ධර්මායතනය, ආරක්ෂක සභාව" යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ධර්මායතනය ආරක්ෂක සභාව සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාව සංස්ථාගත කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ජාතික, ආගමික සහ සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම;

(ආ) ධර්මායතනය නඩත්තු කිරීම හා වැඩිදියුණු කර පවත්වාගෙන යාම සහ කොළඹ, බෞද්ධාලෝක මාවතේ අවුකන අනුරූ බුදු පිළිම වහන්සේ ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම;

(ඇ) බෞද්ධ දර්ශනය හා බෞද්ධ ජීවන මාර්ගය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) වැල්ලවත්ත, බෝධි රුක්ඛාරාම පාරේ, අංක 48 හි පිහිටි "ලක්විරු සෙවන" පවත්වාගෙන යාම;

(ඉ) දුප්පත්, අනාථ, අංගවිකල සහ මන්ද පෝෂණයෙන් පෙළෙන බෞද්ධ ළමයින්ට උදව් උපකාර කිරීම;

(ඊ) ගිහි පැවිදි බෞද්ධ ජනතාව සඳහා අගනුවර විශ්‍රාම ශාලා ඉදිකිරීම;

(උ) පොත්හල් සහ පුස්තකාල සේවා පිහිටුවා පවත්වාගෙන යාම;

(ඌ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ධර්ම දේශනා හා සාකච්ඡා පැවැත්වීම සහ විද්‍යුත් මාධ්‍ය මගින් ඒවා ප්‍රචාරණය කිරීම;

(එ) ජාතික, ආගමික උන්නතිය සඳහා වැදගත්වන බෞද්ධ පොත්පත්, සඟරා සහ පත්‍රිකා සිංහල, දෙමළ, ඉංග්‍රීසි හා වෙනත් භාෂාවලින් ප්‍රකාශයට පත් කිරීම;

(ඒ) පෞරාණික වස්තු සහ වීර ස්මාරක ප්‍රදර්ශනය කිරීම සහ සංරක්ෂණය කිරීම;

(ඔ) අනාථ සහ මහලු බෞද්ධ තැනැත්තන් සඳහා සමාජ සුභ සාධන මධ්‍යස්ථාන පිහිටුවීම;

(ඕ) භික්ෂූන් වහන්සේලාට, දහම් පාසල් ගුරුවරුන්ට හා ශිෂ්‍යයන්ට පරිගණක පුහුණුව ලබාදීම සහ සන්නිවේදන කටයුතු පිළිබඳ පුහුණුවක් ලබාදීම සඳහා ආයතන පිහිටුවීම;

(ක) දුප්පත් හා අනාථ බෞද්ධ තරුණයන්ට උපකාර කිරීමට වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම සහ බෞද්ධ ළමයි සඳහා පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සහ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම; සහ

(ග) ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි වෙනත් බෞද්ධ සංවිධාන සහ සමාජ සේවා සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම සංස්ථාවේ සාමාජිකයන් අතුරින් මේ පනතේ, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලැබූ ධුර දරන්නන් සංඛ්‍යාවකගෙන් සමන්විත (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ සභාවක් වෙත පැවරේ.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධර්මායතන ආරක්ෂක සභාවේ පාලක සභාව සංස්ථාවේ ප්‍රථම සභාව විය යුතු ය.

(3) ධර්මායතනයේ නිර්මාතෘවර පූජ්‍ය ඇල්ලේ ගුණවංශ ස්ථවිරයන් වහන්සේ ධර්මායතන ආරක්ෂක සභාවේ ප්‍රථම සභාපතිවරයා ලෙස ධුරය දැරිය යුතු ය.

සාමාජික නාම ලේඛනය.

**5**. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සමිතියේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කළ යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

සංස්ථාවේ බලතල.

**6**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා ඉඩම් හෝ ගොඩනැගිලි අත්පත් කර ගැනීමට, මිලට ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට හා අන්‍යාකාරයකින් ලබා ගැනීමට;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීමට හෝ ලබාගැනීමට;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සභාව විසින් සුදුසු යයි සලකන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) දායක මුදල්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවලට අයත් ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට;

(ඊ) යම් තැනැත්තකු, යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(උ) යම් ස්ථාවර දේපළකට හෝ පෞද්ගලික දේපළකට බලපාන කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පාලනය කිරීමට;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහකිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට;

(එ) සංස්ථාවේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී සේවක පිරිස් පුහුණු කිරීම; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දේ කිරීම.

සංස්ථාවේ රීති.

**7**. (1) සංස්ථාව විසින් යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පංතියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ඔවුන් විසින් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සහ සභාවේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම් පැවැත්වෙන වේලාව, ස්ථානය, දැන්වීම් සහ න්‍යාය පත්‍රය, එම රැස්වීම් පිළිබඳ ගණපූරණය සහ එහි දී කටයුතු කළ යුතු ආකාරය;

(ඉ) සභාවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

8. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, ප්‍රදාන, තෙස්තමේන්තු නියාදන, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල් සහ ගාස්තු සභාව විසින් තීරණය කරනු ලබන පරිදි එක බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, වැඩි දියුණු කිරීම, සංවර්ධනය කිරීම හා සංරක්ෂණය කිරීම උදෙසා සංස්ථාව විසින් යම් ක්ෂය අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් ඇති කරනු ලැබිය හැකි ය.

(4) කවර හෝ ආකාරයකින් ලබා ගනු ලැබුව ද, සංස්ථාවේ මුදල් හා දේපළ හුදෙක් මෙහි දක්වා ඇති පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම අරභයා යොදා ගනු ලැබිය යුතු අතර, ඒ මුදල්වලින් හෝ දේපළ වලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත, කෙළින්ම හෝ නොඑසේම, ලාභාංශ හෝ ප්‍රසාද මුදල් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම, කරනු නොලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**9**. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තීයේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංගමය විසින් සහ සංගමයට ගෙවිය යුතු ණය.

**10**. මේ පනත ක්‍රියාත්මකවන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංගමයට ගෙවිය යුතු සියලු ණය, ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**11**. මිලට ගැනීමේ, ප්‍රදානය කිරීමේ, ත්‍යාග කිරීමේ හෝ බදු දීමේ යම් සාධන පත්‍රයක් මත හෝ එවැන්නක් ප්‍රකාර හෝ තෙස්තමේන්තු නීයාදනයක් මත හෝ එවැන්නක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් ලැබෙන චංචල හෝ නිශ්චල සියලු දේපළ අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ 7 වන වගන්තියට අනුකූලව සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ, බැඳ තැබීමේ හෝ යටත් කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

**12.** සභාවේ සාමාජිකයකු සහ ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතුය. තවද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා, හෝ වෙනත් යම් කාර්යයක් සඳහා, ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් සාමාජික මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ ආයතනය හෝ ආයතන කවරේද යන වග, සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**15.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.